# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**
**2026 ජූලි / අගෝස්තු**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාවේ මූලාශ්‍රය අධ්‍යයනය හා බෞද්ධ මනෝ - කායික විශ්ලේෂණයෙහි මූලිකාංග BUPS – 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "යථාර්ථාවබෝධය තුළින් සිදුවන පුද්ගල පාරිශුද්ධත්වය අවධි කිහිපයකින් සමන්විත වේ." මිගසාලා සූත්‍රයෙන් හෙළිවන යථෝක්ත කරුණ පිළිබඳ විමර්ශනයක් කරන්න.

02. ප්‍රිය විප්‍රයෝගයෙන් වන මානසික ගැටලු (වෙනස්වීමේ කාංසාව *Separation Anxiety*) අවම කිරීමෙහිලා තිරෝකුඩ්ඩ සූත්‍රාගත ඉගැන්වීම්හි උපයෝගිතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

03. ඍණාත්මක දෘෂ්ටි මර්ධනය කරමින් මානසික සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ අග්ගිවච්ඡගොත්ත සූත්‍රය ඇසුරෙන් විමර්ශනය කරන්න.

04. පුද්ගලයා සංසාරය තුළ ගමන් කරවන ප්‍රධාන බලවේගයක් ලෙස කර්මය හඳුනාගත හැකිය. ලොණඵල සූත්‍රය හා නිබ්බෙධික සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනයෙහිලා මහාරාහුලෝවාද සූත්‍රයෙන් ලබාගත හැකි බෞද්ධ සදුපදේශ කවරේදැයි සමාලෝචනය කරන්න.

06. විපල්ලාස සූත්‍රයෙන් පිළිබිඹු වන විපරීත සංජානනයන් ප්‍රපඤ්චකරණයට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

07. බෞද්ධ මනෝකායික විද්‍යාව යන්න හඳුන්වමින් එහි අරමුණු හා පරමාර්ථ කවරේදැයි විස්තර කරන්න.

08. බෞද්ධ ඉගැන්වීම්වල දක්නට ලැබෙන මනෝවිද්‍යාත්මක ප්‍රවණතාව සෝදාහරණව විග්‍රහ කරන්න.

09. මානසික සංසිද්ධි පිළිබඳ බෞද්ධ ස්ථාවරය කෙබඳුදැයි සකාරණව පැහැදිලි කරන්න.

10. අභිප්‍රේරණය පිළිබඳ බෞද්ධ හා බටහිර ඉගැන්වීම් තුලනාත්මකව සංසන්දනය කරන්න.

**********************************